ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2864051

ඊමේල් / ஈ-மெயில் / E-mail } info@landcommdept.gov.lk

මගේ අංකය / எனது இல / MY NO } 5/2/6/රන්බිම චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO }
දිනය / திகதி / DATE } 2014.11. 26

---

චක්‍රලේඛ අංක : 2014/03

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

සියලුම නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්).

## <u>ජයභූමි දීමනාපත්‍ර ලබාදී ඇති ඉඩම් මැනීම</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදානපත්‍ර නිකුත් කිරීමේ දී මැනුම්පති විසින් පිළියෙල කළ පිඹුරු හා රේඛා චිත්‍ර යොදාගත යුතු වුවද දීමනාපත්‍ර නිකුත් කිරීම කඩිනම් කිරීමේ අරමුණින් මැනීමකින් තොරව ජයභූමි දීමනාපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත. නිසි පරිදි සකස් කළ පිඹුරක් නොමැතිව නිකුත් කරන ලද ජයභූමි දීමනාපත්‍ර සහිත ඉඩම් වල ක්ෂේත්‍රයේ පවත්නා විවිධ ගැටළු නිරාකරණය කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන බලයලත් මිනින්දෝරුවන් මගින් මැන ගැනීමට නොහැකි ජයභූමි ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැන පිඹුරු සකස් කරදිය යුතුය බව ප්‍රතිපත්තියක් වශයෙන් තීරණය කර ඇත. ඒ අනුව ජයභූමි දීමනාපත්‍ර නිකුත් කර ඇති ඉඩම් මැනීමේ දී දීමනාපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණය හා ලාභියා භුක්තිවිඳින ඉඩම් ප්‍රමාණය අතර වෙනස්කම් පවතින අවස්ථා හඳුනාගෙන ඇත. එබැවින් එවැනි ඉඩම් මැනීමේදී ඉඩමේ ප්‍රමාණයට අදාළ වෙනස්කම් සඳහා ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබාදීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. ඒ අනුව මැනුම්පති වෙත නිකුත් කළ මගේ අංක 5/2/6/රන්බිම චක්‍රලේඛ හා 2009.08.25 දරන ලිපිය සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කළ 2011.11.16 දිනැති 2011/6 දරන චක්‍රලේඛය මෙමගින් සංශෝධනය වන බව කාරුණිකව සලකන්න.

01. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි වන අවස්ථා වලදී, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුවේ.

   I. භුක්ති විඳින ප්‍රමාණය හා ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස පර්චස් 10 කට වඩා වැඩි නොවේනම්, භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන නව දීමනාපත්‍රයක් සකස්කළ යුතු වේ.

   II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස පර්චස් 10 කට වඩා වැඩි වේනම්, එම වැඩි වන ඉඩම් ප්‍රමාණය වෙනම බිම් කැබැල්ලක් ලෙස වෙන් කළ යුතු අතර දීමනාපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබා ගෙන දීමනාපත්‍රයේ ඉඩමට අදාළ තොරතුරු සංශෝධනය කළ යුතු වේ.

02. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවලදී, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුයි.

   භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ... ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවල දී, භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන නව දීමනාපත්‍රයක් සකස්කළ යුතු වේ.

---

03. වාරි පහසුකම් සහිත මඩ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථාවල දී, එම වැඩි වන ප්‍රමාණය රූඩ් 02 කට වඩා අඩු වේ නම් භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන නව දීමනාපත්‍රයක් සකස් කළ යුතු වේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ජයභූමි දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථාවල දී, එම වැඩි වන ප්‍රමාණය රූඩ් 02 කට වඩා වැඩි වේ නම් දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණයට පමණක් රේඛා චිත්‍රයක් ලබාගත යුතු වේ. එසේ වැඩිවන බිම් ප්‍රමාණය වෙන් කර මැනීමට කටයුතු කළ යුතු අතර එම බිම් ප්‍රමාණය සඳහා නිශ්චිත ජල පහසුකම් ලබාගත හැකි වන පරිදි මැනුම් කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කළයුතු වේ.

මෙම උපදෙස්වලට අනුකූලව මැනුම් ඉල්ලීම් යැවීමට ප්‍රාදේශීය ලේකම්වරුන් ක්‍රියා කළ යුතු අතර අදාළ මැනුම් සිදු කිරීම පිළිබඳව බලයලත් මිනින්දෝරුවන්ට සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම මැනුම්පති විසින් සිදු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙම උපදෙස් අනුව සකස් කරන රේඛා චිත්‍රයේ ප්‍රමාණය හා ජයභූමි දීමනාපත්‍රයේ ප්‍රමාණය අතර වෙනස හේතුවෙන් නව දීමනාපත්‍රයක් සකස් කළ යුතු අවස්ථාවල දී අයිතිකරුට කරුණු පැහැදිලි කර දී ජයභූමි දීමනාපත්‍ර වියිමත් පරිදි රජයට භාරගෙන රේඛා චිත්‍රයේ ප්‍රමාණය අනුව රන්බිම දීමනාපත්‍රයක් සකස් කිරීමට කටයුතු කළ යුතුවේ.

දීමනාපත්‍රයේ සඳහන් ප්‍රමාණයට රේඛා චිත්‍රය සකස් කර ඇතිවිට දීමනාපත්‍රයේ අදාළ තොරතුරු නිවැරදි කිරීම සඳහා රජයේ ඉඩම් ආඥාපනතේ 20 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුවේ.

ජයභූමි දීමනාපත්‍රවලට අදාළ ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සලකුණු කිරීමේ දී හා රක්ෂිත ඉඩම් මැන වෙන් කිරීමේදී ගැටළු ඇතිවන්නේනම් එම ගැටළු නිරාකරණය කිරීම හා ප්‍රවේශ මාර්ග සලකුණු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරු හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරු / සහකාර ඉඩම් කොමසාරිස්වරු මැදිහත් වී ක්‍රියා කළ යුතුය.

- ඉහත උපදෙස් පිළිපැදීමේදී යම් ගැටළුවක් මතු වේ නම් ඒ සම්බන්ධයෙන් මා අමතන ලෙස වැඩිදුරටත් දන්වමි.
- කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දැනුම් දෙන්න.

ආර්. පී. ආර්. රාජපක්ෂ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -

1. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. මිනුම්පති - මේ අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු - දැ.ගැ.ස. හා අ.ක.ස.